# දුතියො පාඨො

# සාධු මත්තඤ්ඤුතා

තිස්සමහාරාජා'පි දෙවසිකං චෙතියපබ්බතෙ භික්ඛුසඞ්ඝස්ස දානං දදමානො 'මහාරාජ, කිං එකමෙව ඨානං භජසි? කිං අඤ්ඤත්ථ දාතුං න වට්ටතී'ති ජානපදෙහි වුත්තො දුතියදිවසෙ අනුරාධපුරෙ මහාදානං දාපෙසි. එකභික්ඛු'පි පටිග්ගහණෙ මත්තං න අඤ්ඤාසි. එකමෙකෙන පටිග්ගහිතං ඛාදනීයං භොජනීයං ද්වෙ තයො ජනා උක්ඛිපිංසු. රාජා දුතියදිවසෙ චෙතියපබ්බතෙ භික්ඛුසඞ්ඝං නිමන්තාපෙත්වා රාජන්තෙපුරං ආගතකාලෙ 'පත්තං දෙථා'ති ආහ. 'අලං මහාරාජ, අත්තනො පමාණෙන භික්ඛං ගණ්හිස්සන්තී'ති එකභික්ඛු'පි පත්තං න අදාසි. සබ්බෙ පමාණයුත්තකමෙව පටිග්ගහෙසුං. අථ රාජා 'පස්සථ, තුම්හාකං භික්ඛූසු එකො'පි මත්තං න ජානාති; හීයො කිඤ්චි අවසෙසං නාහොසි; අජ්ජ ගහිතං මන්දං, අවසෙසමෙව බහූ'ති තෙසං මත්තඤ්ඤුතාය අත්තමනො ඉතරෙසඤ්ච අමත්තඤ්ඤුතාය අනත්තමනො අහොසි.

**(පාලි ගද්‍ය පද්‍ය රචනා)**

පද මාලාව

| | | | |
|---|---|---|---|
| **තිස්සමහාරාජා** | (ස) | - | තිස්ස (සද්ධාතිස්ස) මහරජතුමා |
| **දෙවසිකං** | (ත) | - | දිනපතා |
| **චෙතියපබ්බතෙ** | (ස) | - | සෑගිරියෙහි |
| **දදමානො** | (කි) | - | දෙන්නේ |
| **ඨානං** | (කි) | - | තැනක් |
| **භජසි** | (ක්‍රි) | - | සේවනය කරහි |
| **අඤ්ඤත්ථ** | (නි) | - | වෙනත් තැනකට |
| **වට්ටති** | (ක්‍රි) | - | වටී |
| **ජානපදෙහි** | (ත) | - | ජනපදවැසියන් විසින් |
| **වුත්තො** | (කි) | - | කියන ලද්දේ |
| **දුතියදිවසෙ** | (ස) | - | දෙවෙනි දවසෙහි |
| **දාපෙසි** | (ක්‍රි) | - | දෙවීය |
| **පටිග්ගහණෙ** | (සං) | - | පිළිගැන්මෙහි |
| **මත්තං** | (නි) | - | පමණ |
| **එකමෙකෙන** | (සං) | - | එක් එක් භික්ෂුව විසින් |
| **පටිග්ගහිතං** | (කි) | - | පිළිගන්නා ලද |
| **ඛාදනීයං** | (කි) | - | කෑ යුතු |
| **භොජනීයං** | (කි) | - | බුදිය යුතු / අනුභව කළ යුතු |
| **උක්ඛිපිංසු** | (ක්‍රි) | - | විසි කළහ |
| **නිමන්තාපෙත්වා** | (පූ.ක්‍රි) | - | ආරාධනා කරවා |
| **රාජන්තෙපුරං** | (ස) | - | රජ ගෙට |



*නොමිලේ බෙදා හැරීම පිණිසයි*

| | | | |
|---|---|---|---|
| ආගතකාලෙ | (ස) | - | පැමිණි කල්හි |
| අලං | (නි) | - | කම් නැත |
| පමාණයුත්තකමෙව | (සං) | - | ප්‍රමාණයෙන් යුත් (භෝජනය) ම |
| පටිග්ගණ්හිංසු | (ක්‍රි) | - | පිළිගත්හ |
| හීයො | (නි) | - | ඊයේ |
| අවසෙසං | (නි) | - | ඉතුරු |
| මන්දං | (නි) | - | ස්වල්ප |
| බහූ | (නි) | - | බොහෝ |
| මත්තඤ්ඤුතා | (ත) | - | පමණ දැනීම |
| අමත්තඤ්ඤුතා | (ත) | - | පමණ නො දැනීම |
| අනත්තමනො | (ස) | - | නො සතුටු සිතැති |

**අභ්‍යාස**

1. 'සාධු මත්තඤ්ඤුතා' ඡේදය සිංහලට නගන්න.
2. ඡේදය ආශ්‍රයෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පාලියෙන් පිළිතුරු සපයන්න.

i. රාජා කෙසං දෙවසිකං දානං අදාසි?
ii. ජානපදිකා කිං වදිංසු?
iii. දුතියදිවසෙ ආගතභික්ඛූ රාජානං කිං අභාසි?
iv. තෙ දෙව භික්ඛුගණා කථං භත්තං පටිග්ගණ්හිංසු?
v. ජනා කිං උක්ඛිපිංසු?

3. ඡේදයේ ඇති මහාප්‍රාණාක්ෂර සහිත වචන උපුටා දක්වන්න.

## අක්ෂර ප්‍රභේද

ව්‍යඤ්ජන අක්ෂර පිළිබඳ ව ඉහත පාඩමෙහි දක්වන ලද ප්‍රභේදවලට අමතර ව ව්‍යාකරණ ග්‍රන්ථයන්හි තවත් ප්‍රභේද කිහිපයක් දක්වා ඇත. ඒ අතර **ධනිත** - **සිථිල** ප්‍රභේද ප්‍රධාන ය.

**ධනිතාක්ෂර (මහාප්‍රාණාක්ෂර)**

මහත් ප්‍රාණයකින් නොහොත් ආයාසයකින් උච්චාරණය කළ යුතු අකුරු **ධනිතාක්ෂර** හෝ **මහාප්‍රාණාක්ෂර** නම් වේ. වර්ගාක්ෂරයන්ගේ දෙවන හා සිවුවන අකුරු මේ ගණයට අයත් ය. **(එත්ථ වග්ගානං දුතියචතුත්ථා ධනිතා'ති වුච්චන්ති)**

| | |
|---|---|
| ඛ, | ඝ |
| ඡ, | ඣ |
| ඨ, | ඪ |
| ථ, | ධ |
| ඵ, | භ |

**සිථිලාක්ෂර (අල්පප්‍රාණාක්ෂර)**

සිථිල හෝ ලිහිල් අකුරු නැතහොත් අඩු ආයාසයකින් උසුරුවන අකුරු **සිථිලාක්ෂර** හෝ **අල්පප්‍රාණාක්ෂර** නම් වේ. ධනිත අකුරු හැරුණු විට වර්ගයන්ගේ ඉතිරි අකුරු සිථිල නම් වේ. **(ඉතරෙ සිථිලා)**

**ක, ග, ඞ**
**ච, ජ, ඤ**
**ට, ඩ, ණ**
**ත, ද, න**
**ප, බ, ම**

**අන්තඃස්ථාක්ෂර**

වර්ගයන්ගේ අන්තයෙහි හෙවත් කෙළවර පිහිටි බැවින් **ය, ර, ල, ව** යන අකුරු හතර මෙනමින් හැඳින්වේ.

## අකාරාදි පිළිවෙළ

හෝඩියේ **අකාරයේ** පටන් ඇති අක්ෂරවල අනුපිළිවෙළට වචන ලියා දැක්වීම අකාරාදි පිළිවෙළ නම් වේ. එහි දී පළමුවෙන් වචනයේ ආරම්භක අකුර සැලකිය යුතු ය. පහත සඳහන් නිදසුන දෙස බලන්න.

**කාලවාපි, මහාසයො, සුසිරං, වධකා, අඞගණං,**
**උදරං, ආපණං, ඔදනො, ලතා, ඉසි**

ඉහත සඳහන් පාලි වචන අකාරාදි පිළිවෙළට සකස් කළ පසු පහත සඳහන් පරිදි වේ.

**අඞගණං**
**ආපණං**
**ඉසි**
**උදරං**
**ඔදනො**
**කාලවාපි**
**මහාසයො**
**ලතා**
**වධකා**
**සුසිරං**

වචන මාලාවක් අකාරාදි පිළිවෙළට සැකසීමේ දී සැලකිය යුතු කරුණු කිහිපයකි.

- පළමුවෙන් ම ස්වරයකින් පටන් ගන්නා වචන ද ඉක්බිති ව ව්‍යඤ්ජනයකින් පටන් ගන්නා වචන ද සැලකිය යුතු ය.
- එක ම ව්‍යඤ්ජනාක්ෂරයෙන් පටන් ගන්නා වචන කිහිපයක් ඇති විට ව්‍යඤ්ජනාරූඪ ස්වරයන්හි අනුපිළිවෙළට සකස් කළ යුතු ය.
- පළමු අකුරෙහි ස්වර මෙන් ම ව්‍යඤ්ජන ද සමාන වන විට දෙවන අකුරෙහි ව්‍යඤ්ජනය හා ස්වරය සැලකිය යුතු ය.
- දෙවන අකුරෙහි ද ව්‍යඤ්ජනය හා ස්වරය සමාන වුවහොත් පිළිවෙළින් තෙවන සිවුවන ආදි අකුරු සලකා පිළිවෙළ සැකසිය යුතු ය.
- බැඳි අකුරකින් පටන් ගන්නා වචනයක් වුවහොත් පළමු ව්‍යඤ්ජනය ද දෙවන ව්‍යඤ්ජනය ද අනතුරු ව ස්වරය ද සලකා බැලිය යුතු ය.

| අකාරාදි පිළිවෙළට සැකසීමට පෙර | අකාරාදි පිළිවෙළට සැකසූ පසු |
|---|---|
| ආතුරො | අඞ්කුසං |
| කලන්‍දකො | අඞ්ගුලිං |
| අඞ්ගුලිං | ආතුරාලයං |
| දහරො | ආතුරො |
| අඞ්කුසං | කලන්‍දකො |
| බිලං | කලෙබරං |
| දාසො | දහරො |
| ආතුරාලයං | දාසො |
| කලෙබරං | බිලං |
| බිළාලො | බිළාලො |

**අභ්‍යාස**

1. ධනිත, සිථිල, වර්ගාන්ත යන ප්‍රභේදයන්ට අයත් අක්ෂර සංඛ්‍යාව දක්වා එම අකුරු වෙන වෙන ම ලියන්න.

2. පහත සඳහන් අක්ෂරවලින් ආරම්භ වන පාලි වචන දෙක බැගින් ලියන්න.

   ක, ච, ප, ධ, ජ

3. පහත සඳහන් වචන අකාරාදි පිළිවෙළට ලියන්න.

   පබ්බතං, පබ්බජ්ජා, භික්ඛා, නිදාසං, නිදානං,
   සිඛරං, උදුක්ඛලං, උදකං, පථිකො, ඔත්තප්පං,
   කුම්භං, පතිං, කුටියී, ගගනයානං, පඞ්කං,
   ගගනඞ්ගණං, පඞ්කජං, ජලධිං, ජලජං, ජනතා

4. 'සාධු මත්තඤ්ඤුතා' ඡේදයේ ඇති ස්වරයකින් පටන් ගන්නා වචන උපුටා දක්වා අකාරාදි පිළිවෙළට සකස් කරන්න.

5. 'සාධු මත්තඤ්ඤුතා' ඡේදයේ ඇති මහාප්‍රාණාක්ෂර සහිත වචන උපුටා දක්වා අකාරාදි පිළිවෙළට සකස් කරන්න.

6. සිංහලට නගන්න.

i. ව්‍යාධො මිගං මාරෙති.
ii. මාතා පුත්තං ලාලෙති.
iii. අහං සිප්පං උග්ගණ්හාමි.
iv. සො ඝටෙන ජලං ආහරති.
v. හත්ථිපාලකො ගජං විනෙති.

7. පාලියට නගන්න.

i. ඇත්ත කියන්නා ජයගනී.
ii. මව පුතාට අවවාද දෙයි.
iii. ගුරුවරයා සිසුන් හික්මවයි.
iv. රජතුමා රට පාලනය කරයි.
v. මේ මගේ පිරිවෙණ යි.